முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

**වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**Provincial Education Department (NWP)**

11 | S | I

තෙවන වාර විභාගය 2023(2024)
மூன்றாம் தவணைப் பரீட்சை 2023(2024)
Third Term Examination 2023(2024)

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

11 වන ශ්‍රේණිය
தரம் 11
Grade 11

පැය තුනයි
மூன்று மணித்தியாலம்
Three hours

අමතර කියවීම් කාලය — මිනිත්තු 10 යි
மேலதிக வாசிப்பு நேரம் — 10 நிமிடம்
Additional Reading time — 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත්, පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදාගන්න.

## ඉස්ලාම් I

- සියලුම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
- පහත සඳහන් පිළිතුරුවලින් ඉතා නිවැරදි පිළිතුර තෝරන්න.

01. රිසාලත් යනු,
1) පිරිසිදුකම 2) දූත මෙහෙවර 3) යහමග 4) ආශ්චර්ය

02. "සබ්උල් මදානි" යන විශේෂ නාමයෙන් හඳුන්වන සූරාව,
1) යාසීන් 2) බකරා 3) ෆාතිහා 4) ඉඛ්ලාස්

03. නබිතුමා මක්කමේදී ජීවත් වූ කාලය,
1) වසර 40ක් 2) වසර 10ක් 3) වසර 63ක් 4) වසර 53ක්

04. "සිප්පීන්" යුද්ධය හේතුවෙන් බෙදනොවූ කණ්ඩායම,
1) මුඃතසිලා 2) ෂීආ අලි 3) ෂීආ මුආවියා 4) ඛවාරිජ්

05. "ඉමාමුල් මුම්දහන්" යන විශේෂ නාමය ලත් විද්වතා කවුද?
1) ඉමාම් මාලික් (රහ්) 2) ඉමාම් ෂාෆිඊ (රහ්)
3) ඉමාම් අබූහනීෆා (රහ්) 4) ඉමාම් අහ්මද් ඉබ්නු හන්බල් (රහ්)

06. ඉස්ලාම් භාෂා ව්‍යවහාරයේ තව්හීද් යන්නෙහි විරුද්ධ පදය කුමක්ද?
1) ෂිර්ක් 2) කුෆ්ර් 3) රිද්දත් 4) ඉල්හාද්

07. වර්ෂ පුරාම එළුවන් 100ක් ළඟ තබාගන්නා අයෙකු සකාත් ලබාදියයුතු එළුවන් ප්‍රමාණය වන්නේ,
1) 1 2) 2 3) 3 4) 4

08. තක්වා යනු දේවභක්තිය වේ. එසේම සුහ්ද් යනු,
1) පිළිවෙත් සුරැකීම 2) පව් සමාව
3) ඇල්මක් නොමැති ජීවතය 4) ඉවසීම

09. අද ඇදහැළුණු ධාරාණුපාතික වැසිනිසා විශාල පොකුණක ජලයෙහි වර්ණය, රසය වැනි ගුණාංග වෙනස්විය. මෙම ජලයෙහි,
1) වුළු කළ හැකිය.
2) වුළු කළ නොහැකිය.
3) වුළු කිරීමෙන් වැළකී සිටීම යහපත්වේ.
4) වුළු කර සලාතය කළ හැකිය, නමුත් පිරිසිදු ජලය ලැබුනහොත් වුළුකර නැවත සලාතය ඉටුකළ හැකිය.

10. මස්ජිදුල් කිබ්ලතෛන් පිහිටි ස්ථානය වන්නේ,
1) මක්කම 2) මදීනාව 3) තායිෆ් 4) ජිද්දා

11. බිරිඳ සමග නැවත එක්වීමට අවස්ථාව ලබාදෙන දික්කසාද ක්‍රමය වන්නේ,
1) ලිආන් 2) බාඉන් 3) රජ්ඊ 4) ලිහාර්

12. ඉස්ලාම් අනුමත කළ වියදමක් සඳහා ණයවී එය පියවා ගත නොහැකි, සකාත් ලැබීමට හිමිකම් ඇති කාණ්ඩය,
1) ෆීසබීල් 2) කාරිමූන් 3) ඉබ්නු සබීල් 4) මිස්කීන්

13. ගාලු කොටුව නැරඹීමට සිසුන් කැඳවාගෙන ගිය ගුරුභාවතා එම සිසුන්ට ප.ව. 2.00 ට පමණ ලුහර් සලාතය සමග අසර් සලාතය එකතුකර නැමදීමට කටයුතු කළේය. මෙම ක්‍රමය වන්නේ,
1) කස්රු 2) ජම්උ 3) ජම්උ දක්දීම් 4) ජම්උ තක්හීර්

14. ජනාසා සලාතයේ දෙවෙනි තක්බීරයෙන් පසු පාරයනය කළයුත්තේ,
1) සූරතුල් ෆාතිහා
2) නබි (සල්) තුමා කෙරෙහි සලවාත් කීම
3) ජනාසාවට ප්‍රාර්ථනා කිරීම
4) සලාම් පැවසීම

15. අර්කානුල් නිකාහ්හි ඇතුළත් වන කරුණක් වන්නේ,
1) මහර් 2) වලීමා 3) දායාදය 4) වලි

16. සලාතයේ ඔබ "ඉහ්දිනස් සිරාතල් මුස්තකීම්" යනුවෙන් පාරයනය කරන වැකියේ අර්ථය වන්නේ,
1) අපි ඔබවම පමණක් නමදින්නෙමු
2) ඔබගෙන්ම පමණක් උපකාර පතන්නෙමු
3) අපිව ඍජු මගට රැගෙන යනු මැනව
4) සැමට කරුණාභරිතයාණෙනි

17. අල් කුර්ආනය ගොනුකිරීමේ මෙහෙවරයට නායකත්වය දුන් සහාබිවරයා කවුද?
1) සයිද් බින් සාබිත් (රළි)
2) අබූ බකර් (රළි)
3) උස්මාන් (රළි)
4) හුදයිබතුල් යමානී (රළි)

18. ඉමාම් මුස්ලිම් (රහ්) තුමා ප්‍රසිද්ධිය ලබා සිටි ක්ෂේත්‍රය,
1) හදීස් 2) ෆික්හ් 3) තෆ්සීර් 4) සීරා

19. "පාරම්පරික සිරිත්විරිත්" යන අර්ථය ලබාදෙන සහාය මූලාශ්‍රය,
1) කියාස් 2) ඉස්තිහ්සාන් 3) ඉජ්මාඋ 4) උර්ෆු

20. නබි (සල්) තුමාගේ සීරාව "සීරත් රසූලුල්ලාහ්" යන නමින් පළමු පොතක් ලියූ විද්වතා වන්නේ,
1) මුහම්මද් බින් කාසිම්
2) උමර් ඉබ්නු අබ්දුල් අසීස්
3) තාරික් බින් සියාද්
4) මුහම්මද් බින් ඉස්හාක්

21. පහත සඳහන් පද කෙරෙහි අවධානය යොමු කරන්න.

A - අස්සබ්ර්
B - අත්තාරීහ්
C - අල් ෆික්හ්
D - අර්රිබා
E - අත් තවක්කුල්
F - අත් තෆ්සීර්
G - අල් මහ්රිබා
H - අල් අකීදා
I - අර් රිළා

ඉහත සඳහන් වගුවෙහි අධ්‍යාත්මික අභිවෘද්ධිය සඳහා වූ කරුණු පෙන්වාදෙන පිළිතුර,
1) A B C D 2) A F G I 3) A E G I 4) D E G I

22. ඉස්ලාමීය අකීදාවේ පියවී ඇසටත් ඉන්ද්‍රියන්ටත් ගෝචර නොවන ජින්වරුන්, මලක්වරුන් රූහ් යනාදිය අඩංගු කොටස්,

1) අර් රූහානියියාත්
2) අල් ඉලාහියියාත්
3) අන් නුබුව්වාත්
4) අස් සම්ඉයියාත්

23. පහත සඳහන් වගුවේ අ, ආ, කොටස් නිවැරදිව ගැලපුවොත් ලැබෙන නිවැරදි පිළිතුර වන්නේ,

| අ | ආ |
|---|---|
| 1. හුදයිබියා | A - සහාබාවරු |
| 2. අකබා | B - යුදෙව්වරු |
| 3. මදීනා ගිවිසුම | C - කුරෛෂිවරු |
| 4. බයිඅතුර් රිල්වාන් | D - අව්ස් - කස්රජ් |

1) B A C D 2) C D A B 3) C D B A 4) D C B A

24. විවාහයේදී ඊජාබ් කබූල් යනාදී දෙකටම සම්බන්ධවූවන් වන්නේ,

1) මනමාලයා, මනමාලිය
2) වලී, මනමාලයා
3) කාලි, වලී
4) මනමාලයා, කාලි

25. පහත "අ" කොටසෙහි ග්‍රන්ථ කතෘවරුන්ද "ආ" කොටසේ ඔවුන් විසින් ලේඛන කරනලද ග්‍රන්ථද සඳහන් වේ.

| අ | ආ |
|---|---|
| i. සිද්ධිලෙබ්බෙ | A - අජා ඉබූල් හින්ද් |
| ii. එමර්සන් ටෙනන්ට් | B - අසන්බෙ ශරිත්තිරම් |
| iii. ඉබ්නු සහ්රයාර් | C - සිලෝන් |

1) A B C 2) B C A 3) C A B 4) D B C

26. අන්වර් නැමැත්තා ව්‍යාපාරයක් ආරම්භ කර වසරක කාලයක් ගිය පසු ඔහු ළඟ ණය වශයෙන් රු.200,000 කුත් ශේෂය වශයෙන් රු. 2,000,000 කුත් තිබුණේය එම වසරේදී රන් පවුමක මිල රු.100,000 ක් විය. එසේ නම් අන්වර් ගෙවිය යුතු සකාත් ප්‍රමාණය කුමක්ද?

1) රු 25,000/= 2) රු 35,000/= 3) රු 45,000/= 4) රු 55,000/=

27. ඉජ්තිහාද් යනු,

1) නීතිවේදීන්ගේ එකමුතුව.
2) උපදේශන සභාව.
3) අලුත් ගැටලුවකට විසඳුම් සෙවීමේ උත්සාහය.
4) ඉස්ලාමීය අධිකරණ ආයතන.

28. නිහාරා ගර්භණී වශයෙන් සිටියදී ඇයගේ සැමියා 2023.06.10 දින මිය ගියේය. ඇය 2023.10.06 දරුවෙකු ප්‍රසූත කළහ. එසේ හෙයින් ඇයගේ ඉද්දා කාලය වන්නේ,

1) 2023.10.06 දක්වා
2) 2024.01.06 දක්වා
3) 2023.09.06 දක්වා
4) 2023.10.20 දක්වා

29. "නියත වශයෙන්ම නුඹ ඇති ශ්‍රේෂ්ඨ වූ යහගුණයන්ගෙන් හෙබිය" යනු,

1) හදීස් වැකියකි.
2) කුර්ආන් වැකියකි.
3) කලීෆාවරුන්ගේ ප්‍රකාශයකි.
4) විද්වතුන්ගේ කියමනකි.

30. "වෙළඳාමේදී බරකතය විනාශ කරදමයි" යනුවෙන් නබිතුමා විසින් අවවාද කළ කරුණු වන්නේ,

1) වංචාව 2) ව්‍යාජ දිවුරුම 3) සඟවා තැබීම 4) රැවටීම

31. "කුත්තාබුල් වහී" යනු,

1) අල් කුර්ආනය වනපොත් කළ අය.
2) අල් කුර්ආනය ලස්සනට පාරායනය කළ අය.
3) අල් කුර්ආනය පැහැදිලි කළ අය.
4) වහී සටහන් කළ අය.

32. ජාහිලියා කාලයේ ගෝත්‍ර නායකයන් හඳුන්වනු ලැබුවේ කෙසේද?

1) කබීලා
2) ශෛකු
3) අසබියියා
4) මුත්ආ

33. "ෆික්හුල් අව්ලවියියාත්" යන පදනමේ සිට පහත සඳහන් ක්‍රියාවලදී ඔබ ප්‍රමුඛත්වය ලබාදිය යුත්තේ කුමක් සඳහා ද?

1) ඉගෙනගත් විෂයයන් පුනරීක්ෂණය කිරීම.
2) ගෙදර වැඩවලදී මවට උදවු කිරීම.
3) අල් කුර්ආනය පාරායනය කිරීම.
4) අනතුරට ලක් වූ අය රෝහලට ගෙන යාම.

34. පරමාන්ත දිනයේ "සකර්" යන නිරයට ප්‍රවේශවන්නේ,

1) සලාතය ඉටුනොකළ අය.
2) සව්මය ඉටුනොකළ අය.
3) සකාත් ඉටුනොකළ අය.
4) හජ් ඉටුනොකළ අය.

35. ඉමාම් මාලික් (රහ්) තුමා විසින් ලියනලද ග්‍රන්ථය වන්නේ,

1) කිතාබුල් උම්මු
2) මුස්නද් අහමද්
3) මුඅත්තා
4) ඉහ්යාඋලූමුද්දීන්

36. අස්මාඋල් හුස්නාහී "අල් ගෆ්ෆාර්" යන පරිශුද්ධ දෙවනාමයේ අර්ථය කුමක් ද?

1) අපිරිමිත දයාවන්තයා
2) මහත් පරිත්‍යාගශීලියා
3) ආධිපත්‍ය දරන්නා
4) මහත් කමා කරන්නා

37. පහත සඳහන් දේ අතර ෆර්ල් අයින් සඳහා වූ උදාහරණයක් කුමක් ද?

1) පංචකාල සලාතය
2) ශ්‍රමදානය
3) ජනාසා දැන්වීම
4) ශාරීරික අභ්‍යාස කිරීම

38. නජ්ජාසි රජුවෙත යවන ලද දූත මණ්ඩලයේ නායකත්වය දැරූ සහාබිවරයා වන්නේ,

1) මුආද් ඉබ්නු ජබල් (රළි) තුමා
2) මුස්අබ් ඉබ්නු උමෛර් (රළි) තුමා
3) ජහ්ෆර් (රළි) තුමා
4) බිලාල් (රළි) තුමා

39. සලාතයේ පළමු තක්බීරයෙන් පසු පාරායනය කිරීම සුන්නත් වූ ක්‍රියාව

1) දුආඋල් ඉස්තිෆ්තාහ්
2) අයතුල් කුර්ෂි
3) සූරා ෆාතිහා
4) කුඩා සූරා

40. නබිවරුන් පාපික්‍රියා කිරීමෙන් ආරක්ෂාව ලැබූ අය යන අර්ථය දෙන අරාබි වචනය කුමක් ද?

1) උලුල් අස්මි
2) මහ්සූම්
3) කාත්තමුන් නබි
4) අබුල් බෂර්

(ලකුණු 40X1 = 40)

முழுப் பதிப்புரிமையுடையது / All Rights Reserved

වයඹ පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව
Provincial Education Department (NWP)

11 S II

තෙවන වාර විභාගය 2023(2024)
மூன்றாம் தவணைப் பரீட்சை 2023(2024)
Third Term Examination 2023(2024)

ඉස්ලාම් I, II
இஸ்லாம் I, II
Islam I, II

11 වන ශ්‍රේණිය
தரம் 11
Grade 11

## ඉස්ලාම් II

❖ පළමු ප්‍රශ්නය සමග තවත් ප්‍රශ්න හතරක් තෝරා ප්‍රශ්න පහකට උත්තර ලියන්න.

01. පහත සඳහන් ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.
   (i) ජබීරත් යනු කුමක්ද?
   (ii) ෆර්ල්හි වර්ග දෙකම කුමක් ද?
   (iii) හජ් ඉටුකිරීම සඳහා නියියත් තබන ක්‍රම දෙකක් සඳහන් කරන්න.
   (iv) අල් බයිඋ හා අල් මුරාබහා අතර තිබෙන වෙනස කුමක් ද?
   (v) රිද්දත් යන්නෙන් අදහස්වන්නේ කුමක් ද?
   (vi) සකාත් ලැබීමට නුසුදුසු කණ්ඩායම් දෙකක් නම් කරන්න.
   (vii) පරිශුද්ධ වූ කෑබාව ප්‍රතිසංස්කරණය කළ නබිවරුන් වන පියා හා පුතා කවුරුන් ද?
   (viii) නජීස්හි කොටස් දෙකක් සඳහන් කරන්න.
   (ix) ශ්‍රී ලංකාවට ඉස්ලාම් දහම හඳුන්වාදීම සම්බන්ධව අදහස් ඉදිරිපත් කර ඇති අරාබි ග්‍රන්ථ දෙකම නම් කරන්න.
   (x) ෆික්හ් කලාවට දායකත්වය දුන් ඉමාම්වරුන් දෙදෙනෙක් සඳහන් කරන්න.

(ලකුණු 10X2 = 20)

02. (i) මුහ්ජිසාත් යනු කුමක් ද?
   (ii) රසූල්වරුන්ට ලබාදෙන ලද ප්‍රාතිහාර්ය තුනක් සඳහන් කරන්න.
   (iii) අල් කුර්ආනයේ සඳහන් වී ඇති ප්‍රාතිහාර්ය පහක් ලයිස්තුගත කරන්න.

(ලකුණු 2+3+5 = 10)

03. (i) මස්ජිදුල් අක්ෂා දේවස්ථානය හඳුන්වාදෙන්න.
   (ii) සකාතය සාමූහික වගකීමකි යන්න සනාථ කිරීමට මූලාශ්‍ර තුනක් ඉදිරිපත් කරන්න.
   (iii) ශාරීරික යෝග්‍යතාව වර්ධනය කිරීම සඳහා උපදෙස් පහක් ඉදිරිපත් කරන්න.

(ලකුණු 2+3+5 = 10)

04. (i) ඉබාදත් හී වර්ග දෙකම සඳහන් කරන්න.
   (ii) ශරීරය හා ක්‍රියාව සම්බන්ධ ඉබාදත් තුනක් සඳහන් කරන්න.
   (iii) දෛනික ක්‍රියාකාරකම් ඉබාදත් බවට පත් කිරීමට අවශ්‍ය කොන්දේසි පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

05. (i) ඉස්ලාම් දැක්මෙන් විවාහයේ අරමුණු දෙකක් සඳහන් කරන්න.

(ii) තරුණ කාලය සාර්ථක කර ගැනීමට ඉස්ලාම් දහම පවසන මාර්ගෝපදේශ තුනක් සඳහන් කරන්න.

(iii) ඉස්ලාමීය ආර්ථික ශ්‍රමයේ වැදගත් කරුණු පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

06. (i) ශ්‍රී ලංකා මුස්ලිම් ජාතීන්ගේ ආරම්භ ජනාවාස පිහිටා තිබූ නගර දෙකක් සඳහන් කරන්න.

(ii) අරාබි ව්‍යාපාරිකයන් ශ්‍රී ලංකාවේ නවාතැන් ගෙන යෑමට හේතුවූ කාරණ තුනක් සඳහන් කරන්න.

(iii) ශ්‍රී ලංකාවේ ආර්ථික සංවර්ධනයට මුල්කාල මුස්ලිම්වරුන්ගේ දායකත්වය අතරින් කරුණු පහක් කෙටියෙන් පැහැදිලි කරන්න.

(ලකුණු 2+3+5 = 10)

07. පහත සඳහන් මාතෘකා දෙකකට කෙටි සටහන් ලියන්න.

(i) ඉපැයීමේ වැදගත්කම.

(ii) සලාතයේ ප්‍රයෝජන

(iii) ආදර්ශවත් මුස්ලිම් පවුල

(iv) එම්.සී. සිද්දි ලෙබ්බෙ තුමා

(ලකුණු 2+3+5 = 10)